# GMOA

**TU No. 291**
**ESTABLISHED IN 1926**

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

**THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION**
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07


07.11.2011

**පුවත්පත් නිවේදනය**

වෛද්‍යවරයෙකු වීමට වෛද්‍ය උපාධිය සහ සීමාවාසික පුහුණුව අනිවාර්යයයෙන් තිබිය යුතු අතර ලෝකයේ උපාධියකින් තොර වෛද්‍යවරු නොමැත. එය සාමාන්‍ය දැනීමට වුවද වැටහෙන කරුණකි.

90 දශකයේදී ඇපෝතිකරි මහතුන්, වෛද්‍යවරු ලෙස උසස්වීම සඳහා ක්‍රමවේදයක් අපේක්ෂා කළහ. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යංශය විසින් "ශාන්ත පීටර්ස්බර්ග්" රුසියානු වෛද්‍ය විද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබාගැනීම සඳහා අවස්ථාව සළසා දුන් අතර ඒ සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩුද ලබාදී තිබුණි. ඒ අවස්ථාව ඔවුන් නිවැරදිව භාවිත කළේ නම් වර්තමානයේදී ඔවුන් වෛද්‍යවරු වී අප සමඟ කටයුතු කරනු ඇත.

නමුත් අදාළ ඇපොතිකරිවරු වැටුප් සහිත නිවාඩු යොදාගනිමින් පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදුණා මිස වෛද්‍ය උපාධිය ලබාගැනීමට අවශ්‍යය පුහුණුව සඳහා යොමු නොවිණි.

නමුත් සියලු පාර්ශවයන් පුදුමයට පත්කරමින් ඔවුන් පූර්ණ කාලීන නේවාසික වෛද්‍ය පාඨමාලාවක් හැදෑරූ බවට රුසියානු වෛද්‍ය පීඨයකින් ගත් බව කියමින් සහතික ඉදිරිපත් කරන ලදි. නමුත් රුසියාවේ නේවාසික පුහුණුව ලැබූ බවට ඔවුන් දක්වන කාලපරිච්ජයේදී ඔවුන් රුසියාවේ නොසිටි බවට ඔවුන්ගේ ගමන් බලපත්‍රයන් සාක්ෂි දරයි.

මෙලෙස වංචනික සහතික ඉදිරිපත් කිරීම සහ වැටුප් සහිත නිවාඩු ලබාදුන් අරමුණු ඉටුනොකිරීම බරපතල වරදක් බව වෛද්‍ය සභාව මඟින් පැවැත්වූ පරීක්ෂණයෙන් මෙන්ම පොලිස් දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වූ පරීක්ෂයෙන්ද තහවුරු විය. එම පරීක්ෂණ අනුව මාස හයක රුසියානු වෛද්‍ය උපාධි සහතිකලාභීන්ව වෛද්‍ය සභාවේ වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචිය ලබා නොදිය යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු ශිරාණි බණ්ඩාරනායක මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 39/2006 මගින් පැහැදිලිව දක්වා ඇත. ගරු ශිරාණි බණ්ඩාරනායක මහත්මිය වැඩිදුරටත් දක්වා සිටියේ මෙම වංචනික සහතිකලාභීන් කිසිදු අයුරකින් නිසි උපාධි ලද පිරිස හා සමාන නොවන බවයි. එබැවින් එම ඇපෝතිකරි පිරිස ලියාපදිංචි කිරීම මගින් නිසි ලෙස උපාධිය ලැබූ උපාධිදාරීන්ගේ මූලික අයිතිවාසිකම් කඩවන බවද පෙන්වා දී ඇත.

මේ කරුණු සලකා බලා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් මෙම වංචනික පුද්ගලයන් සම්බන්ධයෙන්,

1. වැටුප් සහිත නිවාඩු ලබා පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදීම පිළිබඳ අමාත්‍යංශ මට්ටමේ පරීක්ෂණයක් පැවැත්වීමට සෞඛ්‍ය අමාත්‍යංශයෙන් ඉල්ලා සිටීමටත්,
2. වංචනික සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ඉල්ලීම් කිරීමටත්

යන තිරණයන්ට එළඹෙන ලදි.

වෛද්‍ය චන්දික එපිටකඩුව,
ලේකම්.

වැඩිදුර විස්තර — වෛද්‍ය උපුල් ගුණසේකර - 0716841272
වෛද්‍ය සංකල්ප මාරසිංහ - 0714486770